# <u>උපදෙස් පත්‍රිකාව</u>

01. ඔබ ආයතනය සහ ඔබ ආයතනය යටතේ අනු ආයතන පවතී නම්, එම ආයතන වලද සේවය කරන 2025 වර්ෂයට අදාළව **<u>වාර්ෂිකව</u> වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිලධාරින්ගෙන්**, ඔවුන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ, මෙහි **ඇමුණුම II** හි සඳහන් පරිදි 2025.06.30 දින හෝ ඊට ප්‍රථමව කැඳවා ආයතන ප්‍රධානියා විසින් භාර ගත යුතුය.

02. වත්කම් සහ බැරකම් ප්‍රකාශ, ලිපි කවරයක බහා මුද්‍රා තබා වම් පස උඩ කෙළවර **"රහසය" - වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය - CIABOC** යනුවෙන් සඳහන් කර වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කරන්නාගේ නම ලිපි කවරයේ මුහුණතෙහි සඳහන් කර **ඇමුණුම II** හි සඳහන් පරිදි අදාළ ආයතන ප්‍රධානීන් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු තැනැත්තන්ව ආයතන ප්‍රධානියා විසින් දැනුවත් කළ යුතුය.

03. එසේ සුරක්ෂිත අයුරින් භාරගත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ, භාරගත් දිනය සහිතව ආයතන ප්‍රධානියා යටතේ ඇති වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියක හෝ නාම ලේඛනයක සටහන් කර ආයතන ප්‍රධානියා විසින් පවත්වා ගෙන යා යුතු වේ. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තොරතුරු විමසන ඕනෑම අවස්ථාවකදී තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතුද ආයතන ප්‍රධානියා විසින් සිදු කරන මෙන් දන්වා සිටිමි.

04. ඉන්පසු සියලුම ප්‍රකාශ සුරක්ෂිතව **2025.07.07 දින හෝ ඊට ප්‍රථමව** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ **වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශයට <u>පැමිණ</u>** හෝ **<u>කුරියර් මගින්</u>** හෝ **<u>ලියාපදිංචි තැපෑල</u>** ක්‍රමයට හෝ **එවීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුතුය.**

05. වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සම්බන්ධ ලේඛන පහතින් දක්වා ඇත.

5.1. වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ ක්‍රමවේදය ඇතුළත් 2025 වර්ෂයට අදාළ **චක්‍රලේඛය**
5.2. වත්කම් සහ බැරකම් ප්‍රකාශ ආකෘතිය **(ඇමුණුම I)**
***[ඇමුණුම I - මෙම ආකෘතිය අපගේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැක.]***
5.3. වත්කම් සහ බැරකම් ප්‍රකාශ භාර ගත යුතු තැනැත්තන් සඳහන් ලේඛනය **(ඇමුණුම II)**
5.4. වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන් ඇතුළත් ලේඛනය **(ඇමුණුම III)**

ඉහත චක්‍රලේඛය සහ අදාළ ඇමුණුම් භාෂා ත්‍රිත්වයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය **<u>(www.ciaboc.gov.lk)</u>** මගින් ද බාගත කර ගත හැක.

තවදුරටත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කිරීමේ **මාර්ගෝපදේශය** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ඔබගේ පරිශීලනය සඳහා ලබා ගත හැක.

06. මේ සමඟ ඔබ ආයතනය සහ ඔබ ආයතනය යටතේ අනු ආයතන පවතී නම්, එම ආයතන වලද වාර්ෂිකව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිලධාරීන්ගේ තොරතුරු පහත ආකෘතීන් පරිදි සම්පූර්ණ කර එවන මෙන් දන්වා සිටිමි.

**ආකෘතිය 01**

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ආයතනයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව | |
| 02. | වාර්ෂිකව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිලධාරීන් සංඛ්‍යාව | |
| 03. | 2025.06.30 දින හෝ ඊට ප්‍රථමව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව | |
| 04. | 2025.06.30 දින වන විට වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා නොදුන් නිලධාරීන් සංඛ්‍යාව | |

ආකෘතිය 01ට අදාළ තොරතුරු සහ 2025.03.31 දිනට අදාළව 2025.06.30 දිනට වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දුන් හා ලබා නොදුන් නිලධාරීන්ගේ නම් ඇතුළත් නාම ලේඛනයක මෘදු පිටපත් වෙන් වෙන් වශයෙන් 2025.07.07 දින හෝ ඊට ප්‍රථමව MS Excel මඟින් (PDF නොකර) ඉංග්‍රීසි භාෂාවෙන් **assets@ciaboc.gov.lk** ඊමේල් ලිපිනය වෙත යොමු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. මෙහි දෘඪ පිටපත්ද වත්කම් සහ බැරකම් ප්‍රකාශ කොමිෂන් සභාවට එවන විට ඒ සමඟ එවීමට කාරුණික වන්න.

**ආකෘතිය 02**

| Serial No. | Recipients of the Declaration | Full Name | Designation | Institution | NIC | TIN | Mobile Number | Email |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

මීට අමතරව, ආකෘතිය 02හි මෘදු පිටපතක් 2025.05.30 දින හෝ ඊට ප්‍රථමව MS Excel මඟින් (PDF නොකර) ඉංග්‍රීසි භාෂාවෙන් **assets@ciaboc.gov.lk** ඊමේල් ලිපිනය වෙත යොමු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. මෙහි දෘඪ පිටපතක් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කොමිෂන් සභාවට එවන විට ඒ සමඟ එවීමට කාරුණික වන්න.

07. ඔබ ආයතනය සහ ඔබ ආයතනය යටතේ අනු ආයතන පවතී නම්, එම ආයතනද සෘජුව සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි සුදුසු සම්බන්ධීකරණ නිලධාරියකු (මාණ්ඩලික හෝ තීරණගත හැකි මට්ටමේ සිටින නිලධාරියකු) නම් කර, එම නිලධාරියාගේ සියලු විස්තරද පහත ආකෘතිය ප්‍රකාරව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් වැඩිදුරටත් ඔබට මෙයින් දන්වා සිටිමි.

| ආයතනයේ නම | නම් කළ නිලධාරියාගේ නම | නිත්‍ය තනතුර | දුරකථන අංකය | | විද්‍යුත් තැපැල් ලිපිනය | ෆැක්ස් අංකය |
|---|---|---|---|---|---|---|
| | | | ජංගම | ස්ථාවර | | |
| | | | | | | |

08. ඉහත තොරතුරු සහ ඔබ ආයතනය යටතේ ක්‍රියාත්මක වන අනු ආයතන පවතී නම්, එම ආයතනවල නිවැරදි ලිපිනයන් හා දුරකථන අංක ද සඳහන් කරන ලද ලේඛනයක් "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07." යන ලිපිනයට එවීමට කාරුණික වන්න.